**රේගු නිලධාරීන්ගේ ත්‍යාග අරමුදල - 2019**
**--------------------------------------------**

## 1.1 තත්ත්වාගණනය කළ මතය

රේගු නිලධාරීන්ගේ ත්‍යාග අරමුදලේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා අරමුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන රේගු ආඥා පනතේ (235 වන අධිකාරිය) 153 (2) (ආ) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අරමුදලේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා අරමුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත්

ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව අරමුදල ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ගනුදෙනු ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් “මනාලෙස සැලසුම් කරන ලද” අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 ප්‍රකාරව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව වාර්තා කර තිබුණද, දෙපාර්තමේන්තුව විසින් පනවන ලද දණ්ඩන හා රාජසන්තක කිරීම් ආදායම් මුදල් පදනමට ගිණුම්ගත කිරීමේ ප්‍රතිපත්තියක් අනුගමනය කර තිබුණි. | රේගු දෙපාර්තමේන්තුවේ විවිධ අංශවල ක්‍රියාත්මක වන සංකීර්ණ කාර්යභාරය තුළ ත්‍යාග අරමුදලට අදාලව ගිණුම් සකස් කිරීමේදී එම කටයුතු ආරම්භ කරනු ලබන්නේ මුදල් අංශය වෙත රේගු විමර්ශන අවසන් කර ඒ ඒ අංශ විසින් අදාල ත්‍යාග ලිපිගොනු එවීමෙන් පසුවය. එහිදී එක් එක් ත්‍යාග ගොනුවට අදාලව මෙම ත්‍යාග අරමුදල වෙත ගෙවන මුදල් ප්‍රමාණය පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශ සකස් කරනු ලැබේ. ත්‍යාග ගොනුවක් සකස් කර එයට අදාල ගෙවීම් කිරීම බොහෝ විට එම ගොනුව සකස් කළ මූල්‍ය වර්ෂය තුළදීම සිදු නොවන බැවින් කිසියම් වර්ෂයක් තුළ ආදායම් ලෙස ගිණුම්ගත කළ වටිනාකම වඩා නිවැරදිව පෙන්නුම් කිරීමට මෙම ක්‍රමවේදය තුළ හැකිය. විගණන නිරීක්ෂණය නිවැරදිය. මෙම අරමුදල | උපචිත පදනම අනුගමනය කර මූල්‍ය ප්‍රකාශ පිළියෙල කළ යුතු විම. |

| | | |
|---|---|---|
| (ආ) ඉහත (අ) ප්‍රමිතියේ 21 (ඇ) ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන කට්ටලයක් සමඟ ඉදිරිපත් කළ යුතු සංරචකයන් අතරින් මුදල් ප්‍රවාහ ප්‍රකාශනය එක් සංරචකයක් වුවත් අරමුදලේ මූල්‍ය ප්‍රකාශන කට්ටලය තුළ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය වෙනුවට අරමුදල් ලැබීම් හා ගෙවීම් පිළිබඳ ප්‍රකාශනයක් ඉදිරිපත් කර තිබුණි. | සඳහා වෙනම මුදල් පොතක් හා ලෙජර් ගිණුමක් පවත්වාගෙන නොයන බැවින් මුදල් ප්‍රවාහ ප්‍රකාශයක් පිළියෙළ කිරීම අපහසුය. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශ සමඟ මුදල් ප්‍රවාහ ප්‍රකාශයක් ඉදිරිපත් කළ යුතු විම. |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂයේ අවසාන වන විට විමර්ශන කටයුතු අවසන්ව තිබූ රේගු විමර්ශන 113 කට අදාල ලිපිගොනුවලින් විමර්ශන 90 කට අදාලව ලැබී තිබූ රු.652,704,559 ක දණ්ඩන මුදල්වලින් අරමුදලේ දායකය වූ සියයට 50 ක ප්‍රමාණය වන රු.326,352,280 ක මුදල ගිණුම්වලින් අත්හැරී තිබුණි. | විමර්ශන කටයුතු අවසන් වුවද රේගු නිලධාරීන්ගේ ත්‍යාග අරමුදලට ලැබිය යුතු සියයට 50 ක ප්‍රතිශතය හඳුනාගනු ලබන්නේ ත්‍යාග මුදල ගෙවන අවස්ථාවේදීය. එබැවින් විමසුමේ සඳහන් මුදල ගිණුම්වල ඇතුළත් කර නොමැත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශ උපචිත පදනම මත ගිණුම් සැකසිය යුතුය. |
| (ආ) රේගු ආඥා පනතේ 153 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව දණ්ඩන හා විකුණුම් ආදායමින් රේගු ත්‍යාග අරමුදල සඳහා සියයට 50 ක්ද, කළමනාකරණ හා වන්දි අරමුදල සඳහා සියයට 20 ක්ද වශයෙන් දායක විය යුතු විය. එහෙත් කළමනාකරණ හා වන්දි අරමුදල සඳහා ආදායම් ලෙස හඳුනාගෙන තිබූ සියයට 20 ක දායකය වූ රු.729,362,588 ට සමානුපාතිකව ත්‍යාග අරමුදලේ සියයට 50 ක දායකය රු.1,823,406,470 ක් විය යුතු නමුත් මූල්‍ය ප්‍රකාශනවල ආදායම් ලෙස රු.1,843,013,865 ක් හඳුනාගෙන තිබුණි. ඒ අනුව රු. 19,607,395 ක වෙනස සඳහා හේතු පැහැදිලි නොකෙරුණි. | රේගු ත්‍යාග අරමුදල සඳහා සියයට 50 ක් හා කළමනාකරණ වන්දි අරමුදල සඳහා සියයට 20 ක් වශයෙන් ද ත්‍යාග ගොනුවකින් අරමුදල් බෙදී ගියද ප්‍රමුඛතා පදනම මත කොටස් වශයෙන් ගෙවීමේදී සහ ඔත්තුකරු දීමනා පමණක් ගෙවීමේදී සටහන් කරනු ලබන්නේ රේගු නිලධාරීන්ගේ ත්‍යාග අරමුදල් ලේඛනය පමණි. කෙසේ වුවද පසු අවස්ථාවකදී සම්පූර්ණ ත්‍යාග ගොනුව ගෙවීමේදී අදාල ලෙජර් 02 හි ම නිවැරදි ලෙජර් යොදනු ලැබේ. | එකම ආදායම් ප්‍රභවයක් මත පිහිටා පිළියෙල කරනු ලබන මූල්‍ය ප්‍රකාශ අතර ආදායමේ සමානුපාතික තත්ත්වයක් ඇති වන සේ ගිණුම්කරණ කටයුතු සිදු කල යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ඇ) විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ වියදම ඉක්ම වූ ආදායම රු.105,045,877 ක් ලෙස දක්වා තිබුණද, මෙය වියදම් ඉක්ම වූ ආදායමක් නොවන බවත් තවදුරටත් ත්‍යාග අරමුදලේ උප අරමුදල් සඳහා මුදල් නොගෙවීම හේතුවෙන් ඇති වූ ශේෂයක් බවත් නිරීක්ෂණය වේ. | රු. 105,045,877 ක් මුදල අරමුදල් ලැබීම් වලින් ගෙවීම් අඩු කළ පසු ලැබෙන අගයයි. | වර්ෂය තුළදී ලැබෙන සියළුම මුදල් නිසි පරිදි ගිණුම්ගත කිරීම හා ත්‍යාග මුදල් ලැබීමට නියමිත නිලධාරීන්ට හා උප අරමුදල්වලින් දරනු ලබන ගෙවීම් සිදු කර අරමුදලේ ශුද්ධ ශේෂය නිවැරදිව පෙන්වීම. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 1968 අංක 17 දරන රේගු ආඥා පනතේ 153 (2) (ආ) වගන්තිය | ත්‍යාග අරමුදලින් ත්‍යාග මුදල් බෙදා හැරීම සඳහා මුදල් අමාත්‍යවරයාගේ එකඟතාවය ලබා ගෙන ඒ සඳහා සුදුසු ක්‍රමවේදයක් සකස් කල යුතු වුවද, දෙපාර්තමේන්තුව විසින් රේගු ත්‍යාග මුදල් බෙදා හැරීම සඳහා නිකුත් කර තිබූ 1988 ජනවාරි 28 දින අංක පීඑල් 118 දරන දෙපාර්තමේන්තු නියෝගය සඳහා මුදල් අමාත්‍යවරයාගේ එකඟතාවය ලබා ගෙන ඇති බවට සාක්ෂි විගණනය සඳහා ඉදිරිපත් නොවීය. කෙසේ වුවද, 1999 වසරේ සිට 2019 වර්ෂය දක්වා වර්ෂ 21 ක් තුළ ත්‍යාග මුදල් ලෙස නිලධාරීන් සඳහා රු.15,535,028,822 ක්ද, ඔත්තුකරුවන් සඳහා රු.1,872,960,149 ක් ගෙවා තිබුණි. | රේගු ආඥා පනතේ පනවා ඇති විධිවාධානයන් යටතේ ලැබෙන ප්‍රතිලාභ ක්‍රමය රේගු ඉතිහාසයේ දීර්ඝ කාලයක් තිස්සේ ක්‍රියාත්මක වේ. 1956 දී ප්‍රකාශයට පත් කරන ලද රේගු ආඥා පනතේ 153 වන වගන්තිය මගින් ත්‍යාග ගෙවීමේ යාන්ත්‍රණය පිළිබඳව නිශ්චිතව දක්වා ඇත. ඒ අනුව ලැබෙන දණ්ඩන හෝ ලැබීම් වලින් අඩක් භාණ්ඩාගාර නියෝජිත ලේකම් වෙත ගෙවන අතර අනෙක් අඩ භාණ්ඩ අල්ලා ගන්නා නිලධාරීන්ට හෝ තොරතුරු සපයන්නන්ට හෝ ඒ ආකාරයෙන් එකී පාර්ශවයන් දෙකටම එකතු කරනු ලබන තැනැත්තා විසින් නියම කළ හැකි ආකාරයට ගෙවනු ලැබේ. මෙම යෝජනා ක්‍රමය ගරු මුදල් අමාත්‍යවරයා විසින් අනිවාර්යයෙන්ම අනුමත කළ යුතුව තිබූ නමුත් එම අනුමැතිය මේ වන විට සොයා ගත නොහැක. 153 (අ) 2 වගන්තිය යටතේ රෙගුලාසි ප්‍රකාශයට පත් කර ඇති බැවින් එම වර්ෂයේම දෙපාර්තමේන්තු නියෝග 118 හි ගෙවීම් ක්‍රමය අනුමත කර ඇතැයි | 1968 අංක 17 දරන රේගු ආඥා පනතේ 153 (2) (ආ) වගන්තිය ප්‍රකාරව ත්‍යාග මුදල් බෙදාහැරීම වෙනුවෙන් සකසන ක්‍රමවේදය සඳහා මුදල් අමාත්‍යවරයාගේ එකඟත්වය ලබා ඇති බවට තහවුරු කරගෙන ගෙවීම් කල යුතු වීම. |

අපේක්ෂා කෙරේ.

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.105,045,877 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.122,898,009 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.17,852,132 ක අඩුවීමක් නිරීක්ෂණය විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) රේගු වැරදි සම්බන්ධව සිදු කරන රේගු විමර්ශනවලදී සාමාන්‍ය ක්‍රමයට ආනයනයන් මත රජයට ලැබිය යුතු අවම බදු ආදායමේ ප්‍රමාණය අයකර ගැනීම පිළිබඳ නොසලකා එම අහිමි වූ ආදායමද ඇතුළත් වන පරිදි රේගු වැරදි සම්බන්ධයෙන් දඩ පැනවීමත් එසේ පනවන දණ්ඩන මුදලින් සියයට 50 ක් නිලධාරීන්ට ත්‍යාග ගෙවීමට යෝජනා වීමත් තුළින් රජයට ලැබිය යුතුව තිබූ ආදායම අඩු වීමත්, නිලධාරීන් වෙත බෙදාහරින ත්‍යාග මුදල්වල ප්‍රමාණය වැඩි වීමත් නිරීක්ෂණය විය. මේ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.<br>(i) රටේ පවත්නා නිදහස් ආර්ථික ප්‍රතිපත්ති හේතුවෙන් ආනයනයන්ගේ හා අපනයනයන්ගේ ඇති වී ඇති සංකීර්ණතාවයට ගැලපෙන අයුරින් රේගු ආඥා පනත මෙන්ම මෙම අරමුදල්වල නෛතික ප්‍රතිපාදන විධිමත්ව හා කාලීනව සංශෝධනය කිරීමේ අවශ්‍යතාවය විගණනයේදී නිරීක්ෂණය කෙරේ.<br>(ii) මෙම අරමුදල යටතේ ත්‍යාග ගෙවීම | කළමනාකාරිත්වය විසින් අදහස් දක්වා නොතිබුණි. | රේගු ආඥා පනත මේ වන විට වසර 151 ක් පමණ පැරණි වන අතර එම කාලය තුළදී තිබූ ආනයන අපනයන තත්ත්වයන් මත මෙම පනත පිළියෙල කර තිබුණද එය වර්තමාන ආනයන අපනයන තත්ත්වයන් සැලකිල්ලට ගනිමින් පනත වර්තමාන තත්ත්වයට අනුකූල වන පරිදි පිළියෙල කළ යුතු වීම හා රේගු බදු වංචා සිදුවිය හැකි වැරදි පිළිබඳ අත්දැකීම් පදනම් කරගෙන රේගු ආඥා පනත සංශෝධනය කල යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | සඳහා යෝජිත රේගු විමර්ශන බොහෝමයක්,<br>• භාණ්ඩවල වටිනාකම අඩුවෙන් දැක්වීම<br>• නියමිත භාණ්ඩ වර්ගීකරණ අංකය (HS CODE) වැරදි ලෙස දැක්වීම<br>• ප්‍රකාශ නොකළ භාණ්ඩ රැගෙන ඒම<br>• ප්‍රකාශ කළ භාණ්ඩවලට වඩා වැඩිපුර භාණ්ඩ රැගෙන ඒම<br>• ප්‍රකාශ කළ භාණ්ඩ වෙනුවට වෙනත් භාණ්ඩ රැගෙන ඒම<br>• ශ්‍රී ලංකාවට ආනයනය තහනම් කළ භාණ්ඩ ආනයනය කිරීම හා අපනයනය තහනම් කළ භාණ්ඩ අපනයනය කිරීම<br>• ප්‍රකාශ නොකළ මුදල් දිවයිනට රැගෙන ඒම සහ රැගෙන යාම<br>යනාදී රේගු වැරදි සම්බන්ධයෙන් සිදුකර ඇති ඒවා බව නිරීක්‍ෂණය විය. එවැනි රේගු වැරදි වැළක්වීම සඳහා ශ්‍රී ලංකා රේගුව තුළ ස්ථාවර වැටුප් ලබන නිලධාරීන් සියලුම අංශ සඳහා යොදවා තිබියදී අඛණ්ඩව පවතින මෙවැනි රේගු වැරදි තුළින් රාජ්‍ය ආදායමට සිදුවන අහිතකර බලපෑම පාලනය කිරීම සඳහා ප්‍රමාණවත් ක්‍රියාමාර්ග මේ දක්වා ගෙන ඇති බවක් නිරීක්ෂණය නොවුණි. | | |
| (ආ) | හිඟ දණ්ඩන ආදායම් රැස් කිරීම | | |
| (i) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවීම හිඟහිටව පැවතුණ රු.4,917,293,735 ක දණ්ඩන ආදායම තුල වූ රු.3,351,644,800 ක මුදලක් 2017 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා උපචිත වෙමින් පවතින වටිනාකමක් බව නිරීක්ෂණය විය. එම මුදලින් සමාලෝචිත වර්ෂයේදී කිසිදු මුදලක් අයකරගෙන නොතිබුණි. | කළමනාකාරීත්වය විසින් අදහස් දක්වා නොතිබුණි. | හිඟ දණ්ඩන මුදල් අය කර ගැනීමේ ක්‍රමවේදය සමාලෝචනය කිරීම හා කාලීන විසඳුම් ලබා ගැනීම. |
| (ii) | ඉහත සඳහන් හිඟ මුදල තුල වූ අවස්ථා 15 කට අදාල රු.230,887,320 ක දණ්ඩන මුදලක් සඳහා 2009 වර්ෂයේ සිට මුදල් අමාත්‍යවරයා වෙත අභියාචනා | කළමනාකාරීත්වය විසින් අදහස් දක්වා නොතිබුණි. | හිඟ දණ්ඩන මුදල් අය කර ගැනීමේ ක්‍රමවේදය සමාලෝචනය කිරීම හා කාලීන විසඳුම් ලබා ගැනීම. |

| | | |
|---|---|---|
| ඉදිරිපත් කර ඇති බවට වාර්තා වී තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් අයව තිබුණේ රු.64,565,588 ක් පමණක් බව නිරීක්ෂණය විය. | | |
| (iii) හිඟ දණ්ඩන ආදායමට අදාල ලිපිගොනු 113 ක ප්‍රමාණයෙන් රු.24,550,000 කට අදාල ලිපිගොනු 02 ක් රේගු පරිශ්‍රය තුල අස්ථානගතවී ඇති බව තවදුරටත් නිරීක්ෂණය විය. | කළමනාකාරීත්වය විසින් අදහස් දක්වා නොතිබුණි. | වගකිව යුතු පාර්ශවයන්ට එරෙහිව විධිමත් පියවර ගැනීම. |
| (ඇ) විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු පිළිබඳව වරින්වර රේගු අධ්‍යක්ෂ ජනරාල්ගේ අවධානයට යොමු කරන ලද අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතු වේ. | | |
| (i) විධිමත් පරිදි ලෙජර් ගිණුම් පද්ධතියක් පවත්වා ගෙන යාමට කටයුතු කර නොතිබීම හා උපචිත පදනම මත ගිණුම් පිළියෙල නොකිරීම. | විධිමත් ගිණුම් පද්ධතියක් පවත්වාගෙන යනු ලැබේ. උපචිත පදනම මත ගිණුම් පළියෙල කළ ද ආදායම් හඳුනාගත හැකි වන්නේ ත්‍යාග ගොනු ගෙවීමට ඉදිරිපත් වන අවස්ථාවේදී පමණි. | පවතින පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් පිළිබඳව අවධානය යොමු කොට ක්‍රමවත් පාලන පද්ධතියක් පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය කටයුතු කළ යුතුය. |
| (ii) ත්‍යාග මුදල් ගණනය කිරීමේදී රජයේ බදු ආදායම සුරක්ෂිත වන ලෙසටත් ,රේගු බදු වංචාවන්වල පාලනයක් ඇති වන ලෙසටත් හා රේගු බදු වංචාවන්වල නිරත පාර්ශවයන්ට උපරිම අවාසියක් ලැබෙන ලෙසටත් වූ ප්‍රායෝගික ගණනය කිරීමේ ක්‍රියාමාර්ගයක් අනුගමනය කර නොතිබීම. | කළමනාකාරීත්වය විසින් අදහස් දක්වා නොතිබුණි. | පවතින පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් පිළිබඳව අවධානය යොමු කොට ක්‍රමවත් පාලන පද්ධතියක් පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය කටයුතු කළ යුතුය. |
| (iii) ගිණුම් අංශය වෙත ත්‍යාග ගොනු ලද අවස්ථාවේදී එම ගොනු ලේඛනගත නොකිරීම හා අනුපිළිවෙල අනුව ගෙවීම් නොකිරීම. | ගිණුම් අංශය වෙත ත්‍යාග ගොනු ලැබෙන අවස්ථාවේදී ඒවාට අනුක්‍රමික අංකයක් ලබා දෙන අතර ත්‍යාග ගොනු ගෙවීම් සිදු කරනුයේ එම අනුක්‍රමික අංක පිළිවෙලටය. කෙසේ වුවද විශේෂ අවස්ථාවලදී අදාල ඉල්ලීම් පරිදි ප්‍රමුඛතා පදනම මත ත්‍යාග ගොනු සඳහා | පවතින පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් පිළිබඳව අවධානය යොමු කොට ක්‍රමවත් පාලන පද්ධතියක් පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය කටයුතු කළ යුතුය. |

ගෙවීම් කර අවස්ථා තිබේ.

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

**3.2.1 කාර්යසාධනය**

රේගු ආඥා පනතේ 153 (2) (ආ) ඡේදය ප්‍රකාරව විවිධ රේගු වැරදි සඳහා පනවනු ලබන දණ්ඩන මුදල් සහ රාජසන්තක කළ භාණ්ඩ විකිණීමෙන් ලැබෙන මුදල්වලින් සියයට 50 කට සමාන මුදල් ප්‍රමාණයක් රේගු නිලධාරීන්ගේ ත්‍යාග අරමුදලට බැර කරනු ලබන අතර රේගු බදු වංචාවන් අනාවරණය කරගැනීම, පාලනය කිරීම හා වැළැක්වීම වැනි අරමුණු පෙරදැරි කරගෙන නිලධාරීන්ට හා ඔත්තුකරුවන්ට ත්‍යාග ලබාදීම සඳහා මෙම අරමුදල පිහිටුවා තිබේ. 2012 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා වූ කරනු ලැබූ ගෙවීම් පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

| වර්ෂය | ගෙවන ලද ත්‍යාග ලිපිගොනු සංඛ්‍යාව | ගෙවන ලද මුළු ත්‍යාග මුදල | නිලධාරීන් සඳහා ගෙවන ලද කොටස | ඔත්තුකරුවන් සඳහා ගෙවන ලද කොටස |
|---|---|---|---|---|
| | | රු. | රු. | රු. |
| 2012 | 183 | 952,882,430 | 658,519,186 | 128,208,276 |
| 2013 | 286 | 1,509,280,909 | 1,089,268,962 | 121,281,124 |
| 2014 | 343 | 1,353,531,889 | 953,858,131 | 117,310,035 |
| 2015 | 274 | 1,252,772,591 | 1,090,976,365 | 123,347,553 |
| 2016 | 279 | 2,371,231,289 | 1,629,006,445 | 185,138,406 |
| 2017 | 246 | 2,316,128,767 | 1,658,990,867 | 109,462,461 |
| 2018 | 266 | 2,462,038,890 | 1,635,981,137 | 237,337,440 |
| 2019 | 231 | 1,843,013,865 | 1,104,988,629 | 295,409,615 |
| | | 14,060,880,630 | 9,821,589,722 | 1,317,494,910 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|

| | | |
|---|---|---|
| (අ) 2012 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා එකතුව රු.11,139,084,632 ක මුදලක් නිලධාරීන් හා ඔත්තුකරුවන් අතර බෙදා හැර තිබුණු අතර, මින් රු.9,821,589,722 ක් හෙවත් සියයට 88 ක් නිලධාරීන් වෙත ගෙවා තිබුණි. ඒ අනුව රේගු නිලධාරීන්ට ත්‍යාග ගෙවීම සඳහා විධිමත් ක්‍රමවේදයක් මේ දක්වාත් පිළියෙල කර නොතිබුණි. | විගණන නිරීක්ෂණය නිවැරදිය. | නිලධාරීන් සඳහා ත්‍යාග මුදල් ගෙවීමේදී වර්තමාන තත්ත්වයට ගැලපෙන පරිදි සුදුසු ක්‍රමවේදයක් හඳුන්වා දිය යුතුය. |
| (ආ) 2012 වර්ෂයේදී නිලධාරීන්ට හා ඔත්තුකරුවන්ට ගෙවූ මුදල රු.මිලියන 787 ක් පමණක් වුවද, 2019 වන විට එය මිලියන 1,400 ක් දක්වා එනම් සියයට 78 කින් වැඩි වී තිබුණි. එසේම මෙම මුදල් ගෙවා ඇත්තේ ඒ ඒ වර්ෂවලදී විමර්ශන කටයුතු නිම වූ රේගු වැරදි කිහිපයක් සම්බන්ධයෙන් වුවද, විමර්ශන කටයුතු නිම නොවූ සිද්ධි ප්‍රමාණය බෙහෙවින් ඉහළ අගයක් ගෙන තිබූ බව නිරීක්ෂණය විය. ඒ අනුව රේගු බදු වංචාවන්ගේ සැළකිය යුතු පාලනයක් හෝ අඩුවීමක් ත්‍යාග යෝජනා ක්‍රමය යටතේ සිදුවී ඇති බවක් නිරීක්ෂණය නොවේ. | මෙම වාර්තාවේ 1.6 යන ඡේදයට ලබා දී ඇති පිළිතුර අදාල වේ. | නිලධාරීන් සඳහා ත්‍යාග මුදල් ගෙවීමේදී වර්තමාන තත්ත්වයට ගැලපෙන පරිදි සුදුසු ක්‍රමවේදයක් හඳුන්වා දිය යුතුය. |
| (ඇ) ත්‍යාග අරමුදලේ උප අරමුදලක් වන ඉන්ධන අරමුදලට සමාලෝචිත වර්ෂයේදී රු.51,904,699 ක් බැර කර තිබුණි. එම අරමුදල පිහිටුවීමේ අරමුණු ලෙස රේගු විමර්ශන සඳහා අවශ්‍ය ඉන්ධන වියදම් පියවා ගැනීම බව දක්වා තිබුණ ද, විමර්ශන කටයුතු සඳහා දරන ඉන්ධන පිරිවැය දෙපාර්තමේන්තුවේ පොදු වැය ශීර්ෂයට වැය බරක් වී තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළ එම අරමුදලෙන් රු.12,099 ක වියදමක් පමණක් දරා තිබුණි. එසේ වුවද සාධාරණ අවශ්‍යතාවයන් නොසලකා දිගින් දිගටම මෙම අරමුදලට මුදල් රැස්කර තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට එහි ශේෂය රු.555,279,601 ක් වී තිබුණි. | වර්ෂය තුළ ඉන්ධන අරමුදල යටතේ ගෙවීම් සඳහා ඉල්ලීම් ඉදිරිපත් වී නොමැත. | (i) අවශ්‍යතාවය මත නිවැරදි ඇස්තමේන්තු නිශ්චය නොකොට මුදල් වෙන් කිරීම හේතුවෙන් විශාල මුදලක් සමුච්චනය වීම නිවැරදි කිරීම.<br>(ii) භාණ්ඩාගාරයෙන් විමසා අරමුදලේ අතිරික්තය පිළිබඳව සුදුසු පරිදි කටයුතු කිරීම. |
| (ඈ) ත්‍යාග අරමුදලේ උප අරමුදලක් වන මත්ද්‍රව්‍ය වැටලීම් සඳහා සහභාගී වන නිලධාරීන් වෙනුවෙන් ගෙවීම් සඳහා වන මත්ද්‍රව්‍ය නිවාරණ අරමුදල (නාකොටික් අරමුදල) සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.17,624,614 ක් අරමුදලට බැර කර තිබුණද සමාලෝචිත වර්ෂයේදී වැය කර තිබුණේ රු.5,428,546 ක් පමණි. | දෙපාර්තමේන්තු චක්‍රලේඛ ප්‍රකාරව මෙම උපඅරමුදලට අදාල අරමුදල් මාරු කර ඇති අතර වර්ෂය තුළ සිදුකරන ලද ඉල්ලීම් සඳහා අදාල ගෙවීම් සිදු කර ඇත. | මත්ද්‍රව්‍ය වැටලීම් සම්බන්ධ නිලධාරීන් වෙනුවෙන් මත්ද්‍රව්‍ය නිවාරණ අරමුදල මගින් කල යුතු ගෙවීම් පවතීනම් ඒවා නිරාකරණය කර අතිරික්තතා සම්බන්ධයෙන් භාණ්ඩාගාරය සමඟ සාකච්ඡා කර අවශ්‍ය පියවර ගැනීම. |
| (ඉ) විමර්ශන කටයුතු සඳහා සෘජුව දායක නොවන නමුත් සහායක සේවා සපයන අංශවල නිලධාරීන් සඳහා ගෙවීම් වෙනුවෙන් පිහිටුවා ඇති සියයට 2.5 ක අරමුදල සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.25,952,366 ක් බැරකර තිබුණද සමාලෝචිත වර්ෂය තුළ කිසිදු මුදලක් වැය කර නොතිබුණි. | දෙපාර්තමේන්තු චක්‍රලේඛ ප්‍රකාරව මෙම උප අරමුදලට අදාල අරමුදල් මාරු කර ඇති අතර වර්ෂය තුළ ගෙවීම් සඳහා ඉල්ලීම් ඉදිරිපත් | අරමුදලේ සමුච්චනය වී ඇති මුදල් පිළිබඳව භාණ්ඩාගාරය විමසා කටයුතු කිරීම. |

වී නොමැත.